# පෙරවදන

කම්කරු දෙපාර්තමේන්තුවේ නව කම්කරු කොමසාරිස් ජනරාල් වශයෙන් 2011 වර්ෂයේ රාජකාරි භාරගැනීමෙන් අනතුරුව ප්‍රධානතම අවශ්‍යතාවය වූයේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ප්‍රාදේශීය කාර්යාල මගින් සේවක හා සේව්‍ය ප්‍රජාව වෙත ඉටුකෙරෙන මෙහෙවර තවදුරටත් විධිමත් හා කාර්යක්ෂම කිරීමයි. මෙහිදී අවධානය යොමු කල ඉතා වැදගත්ම කාර්යභාරය වූයේ අණ පනත් වලින් නියමිත සේවා කොන්දේසි හා ආරක්ෂාව,කම්කරු පරීක්ෂණ මඟින් තහවුරු කිරීමත් ආයතනික සහයෝගීතාවය වර්ධනය කර කාර්මික සාමය ස්ථාපිත කිරීමත්ය.

මේ සඳහා ප්‍රාදේශීය මට්ටමින් පිහිටි දිස්ත්‍රික් කම්කරු කාර්යාල 39 ක්, උප කම්කරු කාර්යාල 17 ක් හා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10ක් යටතේ පරීක්ෂණ මෙහෙයවීම සිදු කරන ලදී. මෙම පරීක්ෂණ වල ගුණාත්මකභාවය මැන බැලීමට හා නිලධාරීන්ට තමන්ගේ ප්‍රගතිය එම පළාතේ අනෙකුත් කාර්යාල සමඟ සසඳා බැලීමට හැකි වන පරිදි ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී. වර්ෂය තුළ වැඩි රැස්වීම් වාර සංඛ්‍යාවක් පැවැත්වීමට කටයුතු කිරීම තුළින් ක්ෂේත්‍ර කටයුතු පිළිබඳ නිරන්තර සුපරීක්ෂණයක් සිදු කිරීමට හැකිවිය. එමෙන්ම ප්‍රාදේශීය කාර්යාල වල ඇති අවශ්‍යතා හඳුනා ගැනීමට හැකි වූ අතර, ඒ සඳහා කඩිනම් පිළියම් යෙදීමේ අවස්ථාවද සැලසිනි.

කම්කරු නිලධාරීන්ගේ වැටුප් විෂමතාවයක් මත ඇති වූ වෘත්තීය ක්‍රියාමාර්ග හේතුවෙන් කම්කරු පරීක්ෂණ ක්‍රියාවලියේ යම් පසුබෑමක් වර්ෂය අවසාන භාගය තුල ඇතිවිය. නමුත් මෙම ගැටළුව සාකච්ඡා මාර්ගයෙන් නිරාකරණය කර ගැනීමට හැකි වූ අතර අධිකරණ කටයුතු බාධාවකින් තොරව සිදු කර ගැනීමට කටයුතු කරන ලදී.

සමස්තයක් ලෙස බලන විට 2011 වර්ෂය නව ආරම්භයක් ලෙස පෙනී යයි. සැලසුම් සහගතව ක්ෂේත්‍ර කටයුතු වර්ධනය කර ගැනීම පිණිස දෙපාර්තමේන්තුවේ විවිධ අංශ ලබාදුන් සහය අගය කොට සලකමි. එසේම කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයත්, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මෙරට නියෝජිත ආයතනයත් දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා ලබාදුන් දායකත්වය කෘතඥතා පූර්වකව සිහිකරමි.

වී.බී.පී.කේ වීරසිංහ
කම්කරු කොමසාරිස් ජනරාල්

කම්කරු දෙපාර්තමේන්තුව
කම්කරු මහලේකම් කාර්යාලය
කොළඹ 05

# පටුන


| | | |
|---|---|---|
| 1. | කම්කරු දෙපාර්තමේන්තුව | 01 - 01 |
| 2. | සංවිධාන සටහන | 02 - 02 |
| 3. | කම්කරු පරීක්ෂණ | 03 - 03 |
| 4. | කාර්මික සම්බන්ධතා අංශය | 04 - 05 |
| 5. | ශ්‍රම ප්‍රමිති අංශය | 06 - 06 |
| 6. | නීති ක්‍රියා අංශය | 07 - 07 |
| 7. | කාන්තා හා ළමා කටයුතු අංශය | 08 - 09 |
| 8. | විශේෂ විමර්ශන අංශය | 10 - 10 |
| 9. | සේවක අර්ථසාධක අරමුදල් අංශය | 11 - 12 |
| 10. | කර්මාන්තමය සුරක්ෂිතතා අංශය | 13 - 14 |
| 11. | වෘත්තීය ස්වස්ථතා අංශය | 15 - 15 |
| 12. | සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශය | 16 - 17 |
| 13. | සංඛ්‍යාලේඛන අංශය | 18 - 19 |
| 14. | මුදල් අංශය | 20 - 20 |
| 15. | පාලන අංශය | 21 - 23 |

# 01 කම්කරු දෙපාර්තමේන්තුව

## දැක්ම :

ජාත්‍යන්තර තරගකාරී ආර්ථිකයක් සඳහා කාර්මික සාමය තහවුරු වූ රටක්


## මෙහෙවර :

කාර්මික සාමය තහවුරු වූ යහපත් වැඩ පරිසරයක් ස්ථාපිත කිරීම තුලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියට දායක වීම.

## දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් :

- රටේ කාර්මික සාමය පවත්වා ගෙන යාම උදෙසා කාර්මික ආරවුල් සමථ කිරීම හා කම්කරු නීති ක්‍රියාත්මක කිරීම තුලින් කාර්මික ආරවුල් විසදීම.
- රටේ කාර්මික සාමය තහවුරු කිරීම උදෙසා සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම හා කම්කරු නීති සම්බන්ධයෙන් සේවක ප්‍රජාව දැනුවත් කිරීම.
- කර්මාන්ත ක්ෂේත්‍රයන්ට අදාළ ශ්‍රම ප්‍රමිතීන් ක්‍රියාවේ යෙදවීම, නව කර්මාන්ත ක්ෂේත්‍රයන් පිළිබඳව සමීක්ෂණ සිදුකිරීම හා ඒ සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රමිතීන් සකස් කිරීම.
- සේවක අර්ථසාධක අරමුදල ප්‍රවර්ධනය කිරීම, එහි ප්‍රතිලාභ සාමාජිකයන් වෙත ලබාදීම හා අනුමත පුද්ගලික අර්ථසාධක අරමුදල් අධීක්ෂණය.
- ළමුන්, කාන්තාවන් හා තරුණයන් රැකියාවන් හි නිරත කරවීමේදී ඔවුන්ගේ රැකවරණයට අදාල නීති ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්ත ක්ෂේත්‍රයන් හි සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය ආරක්ෂාවට අදාලව ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේදයන් හඳුන්වා දීම, ඒ පිළිබඳව දැනුවත් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය.


# 02 සංවිධාන සටහන


කම්කරු කොමසාරිස් ජනරාල්
අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (නීතිබලාත්මක කිරීම)
අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (පරිපාලන)
අභ්‍යන්තර විගණන අංශය
කලාප කම්කරු කාර්යාල 11
සංඛ්‍යාලේඛන අංශය
වෘත්තීය ස්වස්ථතා අංශය
කර්මාන්තමය සුරක්ෂිතතා
සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය
සේවක අර්ථසාධක අරමුදල් අංශය
කාන්තා හා ළමා කටයුතු අංශය
විශේෂ විමර්ශන අංශය
ශ්‍රම ප්‍රමිති අංශය
කාර්මික සම්බන්ධතා අංශය
නීති ක්‍රියා අංශය
මුදල් අංශය
පාලන අංශය
දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂණ ඉංජිනේරු කාර්යාල 10
දිස්ත්‍රික් කම්කරු කාර්යාල 39
උප කම්කරු කාර්යාල 17
කාර්මික සම්බන්ධතා ශාඛාව
සේවය අවසන් කිරීමේ ශාඛාව
වෘත්තීය සමිති ශාඛාව
සමාජ සංවාද හා වැඩපොළ සහයෝගිතා ඒකකය
කාර්මික අධිකරණය
පාලන ශාඛාව
ආයතන ශාඛාව
තොරතුරු තාක්ෂණ ඒකකය
පුස්තකාලය

# 03 කම්කරු පරීක්ෂණ

**ජා**ත්‍යන්තර තරඟකාරීත්වය හමුවේ දේශීය නිෂ්පාදන රැක ගනිමින් ජාතික ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා වැඩපොළ සහයෝගීතාවය හා කාර්මික සාමය අත්‍යාවශ්‍ය සාධකයන්ය. විධිමත් කම්කරු පරීක්ෂණ ක්‍රියාවලියක් තුළින් වැඩපොළ අනතුරු අවම කිරීමත්, නියමිත වැටුප් හා සේවා කොන්දේසි ක්‍රියාත්මක කිරීමත්, විශ්‍රාමික දිවිය සඳහා සමාජ සංරක්ෂණය ඇති කිරීමත් මඟින් කාර්මික සාමය ස්ථාපිත කළ හැකිය. කාර්මික ආරවුල් හා වැඩවර්ජන නිවාරණය කොට ඵලදායී වැඩපොළක් නිර්මාණය වන්නේ එවිටය.

සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව 2002 - 2011




| | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව | 10564 | 15278 | 14521 | 10054 | 28597 | 67029 | 70502 | 72339 | 58060 | 83198 |

මෙරට ක්‍රියාත්මක කම්කරු අණපනත් යටතේ සේව්‍ය - සේවක දෙපාර්ශවය වෙත පැවරී ඇති යුතුකම් හා වගකීම් ඉටුකරවා ගැනීම සඳහා කම්කරු පරීක්ෂණ ක්‍රියාවලිය ස්ථාපිත කර ඇත. දෙපාර්තමේන්තුව යටතේ කලාප කම්කරු කාර්යාල 11 ක්, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 39 ක්, උප කම්කරු කාර්යාල 17ක් හා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10ක් ද ක්‍රියාත්මක වන අතර කම්කරු නිලධාරීන් 430ක් හා ඉංජිනේරු නිලධාරීන් 25දෙනෙක්ද ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු වල යොදවා ඇත. මෙම දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරනු ලබන අණ පනත් වලින් කම්කරු පරීක්ෂණ සඳහා බලය ලැබී ඇති අතර, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රඥප්තීන්ට අනුකූලව එම පරීක්ෂණ වල ප්‍රමිතීන් සකස් වී ඇත. ඉහත සංඛ්‍යාලේඛන මගින් පිළිබිඹු වන්නේ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල මගින් පසුගිය වසර 10 තුළ ක්‍රියාත්මක කරන ලද පරීක්ෂණ පිළිබඳ විස්තරයන්ය. ප්‍රධාන කාර්යාලයේ අංශ මගින් හා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල මගින් සිදුකරන ලද පරීක්ෂණ පිළිබඳ විස්තර ඉදිරි පරිච්ඡේදයන් මගින් ඉදිරිපත් කර ඇත.

# 04 කාර්මික සම්බන්ධතා අංශය

රට තුළ මනා සේව්‍ය සේවක සම්බන්ධතාවයක් පවත්වා ගැනීම අරමුණු කරගත් මෙම අංශය මගින් පහත සඳහන් පනත් ක්‍රියාත්මක කරනු ලබයි.


1. 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත
2. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්‍ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත
3. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත
4. 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥා පනත

මෙම කටයුතු ඉටුකිරීමේදී කාර්මික සබඳතා, සේවය අවසන් කිරීමේ, සමාජ කතිකා හා වැඩපොළ සහයෝගීතා, වෘත්තීය සමිති හා කාර්මික අධිකරණය වශයෙන් උප අංශ 5 ක් යටතේ ක්‍රියාත්මක වේ.

කම්කරු දෙපාර්තමේන්තුවෙහි කාර්මික සම්බන්ධතා අංශය කලාප කම්කරු කාර්යාල 11 ක්, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 39 ක් හා උප කම්කරු කාර්යාල 17 ක් සමග එක්ව කාර්මික ආරවුල් විසඳීම සිදු කෙරේ. ඒ අනුව 2011 වර්ෂය තුලදී කාර්මික ආරවුල් 3341 ක් වාර්තා වූ අතර වර්ෂය ආරම්භයේ ඉතිරිව පැවති 2695 ක් ඇතුලත්ව මුළු ආරවුල් 6036 කින් සාකච්ඡා සභා වලදී ආරවුල් 2976 ක් විසදීමට කටයුතු කරන ලදී. එහිදී අයකර ගන්නා ලද මුදල රුපියල් 568,000,527/- කි.

**කාර්මික ආරවුල් විසඳීමේ ප්‍රගතිය 2001 - 2011**

| වර්ෂය | යොමු වූ ආරවුල් | විසඳු ආරවුල් |
|---|---|---|
| 2001 | 20,177 | 13,706 |
| 2002 | 18,760 | 14,847 |
| 2003 | 15,947 | 11,981 |
| 2004 | 12,990 | 9,798 |
| 2005 | 11,271 | 8,491 |
| 2006 | 11,273 | 8,853 |
| 2007 | 7,321 | 5,683 |
| 2008 | 7,558 | 5,469 |
| 2009 | 6,724 | 4,294 |
| 2010 | 5,640 | 2,945 |
| 2011 | 3,341 | 2,976 |




කාර්මික සම්බන්ධතා අංශයට අනුබද්ධ සමාජ කතිකා අංශය මගින් පවත්වනු ලබන සේවක දැනුවත් කිරීමේ වැඩසටහන් වල ප්‍රතිඵල වශයෙන් වාර්තා වන කාර්මික ආරවුල් ප්‍රමාණය ක්‍රමයෙන් අඩු වී ඇත. (2011 අවසාන කාර්තුවට අදාළ කාර්මික ආරවුල් වාර්තා ලැබෙමින් පවතින බැවින් අදාළ සංඛ්‍යාලේඛන ඉදිරියේදී වෙනස් විය හැකිය) එමෙන්ම ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී කම්කරු කොමසාරිස් ජනරාල් විසින් එක් එක් ක්ෂේත්‍ර හා කම්කරු නිලධාරීන්ගේ ඒ ඒ මාසයේ පරීක්‍ෂණ මැන බැලීමේ ක්‍රමවේදය කාර්මික ආරවුල් පාලනයට තවත් හේතුවක් වී ඇත.

**සාමූහික ගිවිසුම්**

2011 වර්ෂය තුලදී කාර්මික ආරවුල් පනතේ විධිවිධානයන් යටතේ ලියාපදිංචි කරනු ලැබූ සාමූහික ගිවිසුම් සංඛ්‍යාව 66 ක් වන අතර කලින් වර්ෂයේදී 42 ක් විය.

**වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම**

2011 වර්ෂය තුල ලියාපදිංචි වී ඇති වෘත්තීය සමිති සංඛ්‍යාව 76 කි. අවලංගු කිරීම් 38 කි. ඒ අනුව 2011 වර්ෂය අවසානයේ දී පැවති මුළු වෘත්තීය සමිති සංඛ්‍යාව 2058 කි.

**කාර්මික අධිකරණ කටයුතු**

කාර්මික සම්බන්ධතා අංශයට අනුබද්ධ කාර්මික අධිකරණය වෙත අනිවාර්ය බේරුම් කිරීම මගින් විසඳීම සඳහා වර්ෂය තුළ යොමු වූ ආරවුල් සංඛ්‍යාව 54ක් වන අතර ප්‍රදානයන් නිකුත් කල සංඛ්‍යාව 34කි.

**සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම**

2011 වසරේදී කාර්මික සම්බන්ධතා අංශය යටතේ ඇති සමාජ කතිකා ඒකකය මගින් ආයතන මට්ටමින් සිදු කරන ලද වැඩසටහන් ගණන 95 ක් වන අතර ඊට සහභාගී වූ සංඛ්‍යාව 4638 කි. එමෙන්ම ආර්ථික අංශ පදනම් කරගෙන වැඩසටහන් 133 ක් පවත්වා ඇති අතර ඊට 6287 ක සංඛ්‍යාවක් සහභාගී වී ඇත.

දිස්ත්‍රික් හා උප කාර්යාල හරහා ආයතන මට්ටමින් වැඩසටහන් 56 ක් සිදු කරන ලදී. ආයෝජන ප්‍රවර්ධන කලාප මට්ටමින් වැඩසටහන් 18 ක් පවත්වා ඇති අතර උපදේශන කමිටු වාර 68 ක් පවත්වා ඇත.

**වැඩ වර්ජන**

| | වතු | | ආයතන | |
|---|---|---|---|---|
| | 2010 | 2011 | 2010 | 2011 |
| වර්ෂය තුළ ඇති වූ වැඩවර්ජන සංඛ්‍යාව | 09 | 14 | 06 | 07 |
| සහභාගී වූ සේවක සංඛ්‍යාව | 3185 | 2713 | 1923 | 3742 |
| අහිමි වූ මිනිස් දින සංඛ්‍යාව | 23037 | 9877 | 2034 | 15543 |

2011 වර්ෂය තුල සිදු වී ඇති වැඩ වර්ජන වලට ද (පෙරදී මෙන් ) වැටුප් ඉහළ නොදැමීම, "නෝම්" අඩු කිරීම හා වැටුප් නොගෙවීම සම්බන්ධයෙන් සහ වතු හා ආයතනයන්හි අභ්‍යන්තර ආරවුල් ප්‍රධාන හේතු වී ඇත.

**1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ සිදු කරන ලද ක්‍රියාකාරකම්.**

| | පැමිණිලි | | අයදුම්පත් | |
|---|---|---|---|---|
| | 2010 | 2011 | 2010 | 2011 |
| වර්ෂය ආරම්භයේ නොවිසඳී ඉතිරිය | 221 | 156 | 12 | 14 |
| වර්ෂය තුල දී ලැබුණු ගණන | 110 | 86 | 27 | 25 |
| | 331 | 242 | 39 | 39 |
| වර්ෂය තුල දී විසඳු ගණන | 175 | 111 | 25 | 29 |
| වර්ෂය අවසානයේ නොවිසඳී ඉතිරිය | 156 | 131 | 14 | 10 |

# 05 ශ්‍රම ප්‍රමිති අංශය

කම්කරු දෙපාර්තමේන්තුවේ ශ්‍රම ප්‍රමිති අංශය මගින් පෞද්ගලික අංශයේ සේවා නියුක්ත අයගේ රැකියා සුරක්ෂිතභාවය හා සුබ සාධනය කෙරේ බලපාන්නා වූ සේවා තත්වයන් හා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සැකසීම හා ඒවාට නෛතික තත්වය ලබාදීමට කටයුතු කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා පහත පනත් යටතේ කටයුතු සිදු කරනු ලබයි.

1. 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත
2. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත
3. 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත

2011 වර්ෂය තුළ ශ්‍රම ප්‍රමිති අංශයේ ක්‍රියාකාරකම් සංක්ෂිප්තව පහත පරිදි වේ.

- නිල කාලය ඉකුත් වූ පඩිපාලක සභා 14 කට අදාල නියෝජිතයන් පත් කිරීම හා පාලක සභා 8 ක මිය ගිය හෝ සේවයෙන් ඉවත් වූ නිලධාරීන් වෙනුවට කෙරෙන පත්කිරීම් සිදු කරන ලදී.

- නව පඩි පාලක සභා පිහිටුවීම යටතේ, අවශ්‍ය තොරතුරු රැස්කර මල්, විසිතුරු පැල, එළවළු සහ පළතුරු වගා කිරීම සහ අපනයනය කිරීම යන පඩි පාලක සභාව පිහිටුවීමට විරෝධතා දැන්වීම් පල කෙරුන අතර එම පිහිටුවීමට අවශ්‍ය ආඥාව සකස් කිරීම හා ජාත්‍යන්තර පාසල් හා අධ්‍යාපන ආයතන සම්බන්ධ තොරතුරු රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම සිදු කරන ලදී.

- හෝටල් හා භෝජනාගාර සේවා කර්මාන්තයට අදාළ සේවා කොන්දේසි තීරණය කරන ලදී.

- පොල් වැවීමේ කර්මාන්තයේ වැටුප 20% කින් වැඩි කිරීමට තීරණය කරන ලදී.

- තේ හා රබර් වැවීමේ සාමුහික ගිවිසුම දීර්ඝ කිරීම (2011.12.01 දින සිට තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තය සහ රබර් වැවීමේ හා සෑදීමේ කර්මාන්ත යන පඩි පාලක සභා වලටද බලපැවැත්වෙන පරිදි සිදු කරන ලදී.)

- දැයට කිරුළ වැඩසටහනට සමගාමීව අනුරාධපුරය දිස්ත්‍රික්කය තුල ශ්‍රම ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම සම්බන්ධ සේව්‍ය, සේවක දැනුවත් කිරීමේ වැඩසටහන් 7ක් අනුරාධපුරය, එප්පාවල, නුවර වැව, මැදවච්චිය, තලාව යන නගර වල පිහිටි කර්මාන්තශාලා වලදී පවත්වන ලදී.

- 1941 අංක 27 දරන පඩි පාලක සභා ආඥා පනත, 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල පනත හා 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනතේ විධිවිධාන වලට අනුව කටයුතු නොකරන සේව්‍යයන් හා ඔවුන්ගේ ව්‍යාපාර ආයතන පිළිබඳ දිස්ත්‍රික් කම්කරු කාර්යාල හා උප කර්යාල මගින් පරීක්ෂා කරනු ලබන අතර, ඒ අනුව සිදු කල මාසික කාලීන පරීක්ෂණ වල ප්‍රගතිය සංඛ්‍යාලේඛනය කිරීම. ශ්‍රම ප්‍රමිති අංශය විසින් සියලුම කාර්යාල දිස්ත්‍රික් කාර්යාල වලින් ලබා ගන්නා එම තොරතුරු විශ්ලේෂණය කර පිළියෙල කරන වාර්තා ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා වෙනත් අදාළ ආයතන වෙත සපයා ඇත. 2011 වර්ෂය තුල තෝරා ගත් දිස්ත්‍රික් කම්කරු හා උප කාර්යාල 20ක මාසික පරීක්ෂණ වල ප්‍රගතිය එම කාර්යාල වෙත ගොස් පරීක්ෂා කර අවශ්‍ය උපදෙස් සපයන ලදී.

# 06 නීති ක්‍රියා අංශය

කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නැංවිය යුතු අණ පනත් වල ප්‍රතිපාදන දිවයින පුරා ක්‍රියාවේ යෙදවීම නිශ්චිත කරනු වස් එම නීති උල්ලංඝනය කරන්නන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත් ඒ තුලින් සේවක අයිතීන් සුරක්ෂිත කරමින් සේව්‍ය සේවක සහයෝගීතාව වර්ධනය කිරීම නීති ක්‍රියා අංශයේ මූලික අරමුණය.

එම ක්‍රියාවලියේ දී කම්කරු නීති උල්ලංඝනය කරන්නන්ට එරෙහිව නෛතික පියවර ගැනීම නීතිය ක්‍රියාවේ යොදවන නිලධාරීන්ගේ නෛතික ගැටලු වලට උපදෙස් ලබා දීම සහ ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීම, මහේස්ත්‍රාත් අධිකරණ වල නඩු මෙහෙයවීම සහ නීතිපති දෙපාර්තමේන්තුව සමඟ දෙපාර්තමේන්තුවට එරෙහිව ඉහළ අධිකරණ නඩු වෙනුවෙන් අවශ්‍ය පියවර ගැනීම නීති ක්‍රියා අංශයේ කාර්යදාමයට අයත් වේ.

2011 වර්ෂය තුළදී නීති ක්‍රියා අංශය මගින් ගොනු කළ නඩු සංඛ්‍යාව හා අයකර ගැනීමට නියමිත මුදල් ප්‍රමාණයන් පහත පරිදි වේ.

| | පනත | නඩු සංඛ්‍යාව | මුදල (රු.) |
|---|---|---|---|
| 01 | පාරිතෝෂික ගෙවීමේ පනත | 4,092 | 1,159,329,226.00 |
| 02 | කාර්මික ආරවුල් පනත | 72 | 3,520,014.50 |
| 03 | සේවය අවසන් කිරීමේ පනත | 65 | 151,730,229.60 |
| 04 | පඩිපාලක සභා ආඥා පනත | 238 | 21,471,740.85 |
| 05 | සාප්පු හා කාර්යාල සේවක පනත | 80 | 9,620,306.61 |
| 06 | ප්‍රසූතිකාධාර පනත | 01 | - |
| 07 | ස්ත්‍රීන් තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත | 05 | - |
| 08 | සේවක අර්ථසාධක අරමුදල් පනත | 3,483 | 3,753,357,651.00 |
| 09 | කම්කරු විනිශ්චය සභා නියෝග | 153 | 70,286,913.63 |
| 10 | අනුමත අර්ථසාධක අරමුදල් | 54 | 2,233,870.46 |

සේවක අර්ථසාධක අරමුදල් පනතේ නඩු පැවරීම් සංඛ්‍යාව දැනට ලැබී ඇති වාර්තා මත සකසා ඇති බැවින් මෙම සංඛ්‍යාව වෙනස් විය හැකිය.

# 07 කාන්තා හා ළමා කටයුතු අංශය

ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ක්‍රියාවලිය තුල විශේෂ දායකත්වයක් ලබා දෙනු ලබන කාන්තාවන්ගේ වෘත්තීය අයිතිවාසිකම්, ආරක්ෂාව හා සුබ සාධනය ඇති කිරීම මෙන්ම ළමා ශ්‍රම යෙදවුම වැළැක්වීමේ අරමුණෙන්ද යුතුව මෙම අංශය පහත සඳහන් අණ පනත් කිහිපයක් ක්‍රියාත්මක කරනු ලබයි.

01. 1956 අංක 47 දරන ස්ත්‍රීන් තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනත
02. 1934 අංක 32 දරන ප්‍රසූතිකාධාර ආඥා පනත
03. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතේ ස්ත්‍රීන් හා තරුණ අයට අදාළ කොටස්
04. 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනතේ ස්ත්‍රීන් හා තරුණ අයට අදාළ කොටස්

කාන්තා ශ්‍රමිකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම්, ආරක්ෂාව, සෞඛ්‍ය හා සුබ සාධනය මෙන්ම ළමා ශ්‍රමය මෙරටින් පිටුදැකීමේ අරමුණ සහිතව 2011 වර්ෂය තුළ මෙම අංශය විසින් ඉටුකල ක්‍රියාකාරකම් පහත දැක්වේ.

## කාලීන පරීක්ෂණ

2011 වර්ෂය තුළදී මෙම අංශය විසින් සාප්පු හා කාර්යාල වල, කර්මාන්තශාලා වල හා වැවිලි අංශයේ සේවිකාවන්ගේ සුබ සාධනය, රැකියා සුරක්ෂිතභාවය හා සේවා කොන්දේසි කඩවීම් යනාදී කරුණු පිළිබඳව කාලීන පරීක්ෂණ 180 ක් සිදුකර ඇත. නොකඩවා කාලීන පරීක්ෂණ සිදුකිරීම තුළින් සේවිකාවන්ට මෙම අංශයෙන් ක්‍රියාත්මක කරනු ලබන නීති වල ආරක්ෂාව නිරතුරුව ලැබේ.

## කාන්තා සේවක පොදු පැමිණිලි පරීක්ෂණ හා ප්‍රසූතිකාධාර පැමිණිලි පරීක්ෂණ

කාන්තා සේවක ගැටළු සම්බන්ධව පැමිණිලි සඳහා අදාල දිස්ත්‍රික් කාර්යාල සමඟ ඒකාබද්ධව විමර්ශනය කර අවශ්‍ය උපදෙස් ලබා දී තිබේ. සේවිකාවන්ට හිමි ප්‍රසූතිකාධාර නොගෙවීම් හා අනෙකුත් සේවා කොන්දේසි සැපයීම සම්බන්ධව ලැබී ඇති පැමිණිලි පිළිබඳ දිස්ත්‍රික් කාර්යාල සමඟ ඒකාබද්ධව පරීක්ෂණ සිදුකර ඇත.

## කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම

ආයතනයෙහි කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අවසර ලබාදීම සඳහා ප්‍රධාන කාර්යාලයේ කාන්තා හා ළමා කටයුතු අංශය මගින් හා දිස්ත්‍රික් කාර්යාල මගින් වසර තුළ පරික්ෂණ 311 ක් සිදුකරන ලදී. එමෙන්ම දින 86 ක් තුළ ආයතන 359 ක් පමණ ආවරණය වන පරිදි විශේෂ රාත්‍රී පරික්ෂණ සිදු කිරිමට කටයුතු කර ඇත.

## ළමා මෙහෙකාර සේවයේ පැමිණිලි පරීක්ෂණ

ශ්‍රී ලංකා පොලීසියේ ළමා හා කාන්තා කාර්යාංශය, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, විවිධ ආයතන හා පුද්ගලයන් මගින් නාමිකව හා නිර්නාමිකව ලැබෙන ළමා සේවක පැමිණිලි විභාග කර බැලීම හා එම සේවා යෝජකයන්ට විරුද්ධව නීතිමය කටයුතු සිදු කිරීම මෙම අංශය මගින් සිදුකරනු ලබයි. ඒ අනුව, මෙම අංශය වෙත ළමයින් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් පැමිණිලි 237 ක් ලැබී ඇති අතර පරීක්ෂණ පවත්වා නඩු පැවරීම් 09 ක් සිදුකර ඇත.

**ජාත්‍යන්තර කාන්තා දිනය 2011.03.08**

ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් උත්සවය පිළියන්දල විද්‍යාලෝක මහා විද්‍යාලයේදී පවත්වන ලදී. මෙම සැමරුම් උත්සවයට සමගාමීව කොළඹ දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී කාන්තාවන් 200 දෙනෙකු සඳහා ස්වයං රැකියා පිළිබඳව පුහුණු වැඩමුළු, එම නිල උත්සවයට පෙර (මාර්තු 05 වන දින) පවත්වන ලද අතර මෙම වැඩමුළුවෙන් ලද පුහුණුවට අදාළ කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා ස්වයං රැකියා උපකරණ කට්ටල 200ක් ලබා දෙන ලදී.

**ළමා ශ්‍රමයට එරෙහි ජාත්‍යන්තර දිනය 2011.06.12**

නව පනත් සංශෝධනයන් මගින් අනර්ථකාරී රැකියාවන් ලෙස හඳුනා ගන්නා ලද රැකියාවන් 51ක් පිළිබඳව සහ රෙගුලාසි පිළිබඳව පුවත්පත් දැන්වීම් (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්) පළ කිරීමට කටයුතු කරන ලදී. ඊට සමගාමීව මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් කොළඹ 07, ඔලිම්පික් නිවහනේදී පවත්වන ලදී.

**විශ්ව ළමා දින සැමරීම 2011.10.01**

ළමා ශ්‍රම යෙදවුම වැළැක්වීම පිළිබඳව කරුණු ඇතුළත් "අතුරු මිතුරු" වීදි නාට්‍ය විශ්ව ළමා දිනය නිමිති කොටගෙන 2011.10.01 දින දෙහිවල සත්ව උද්‍යානයේදී ප්‍රදර්ශනය කරන ලදී.

දැයට කිරුළ ප්‍රදර්ශනය - 2012 ට සමගාමීව අනුරාධපුර ස්වර්ණපාලී බාලිකා මහ විද්‍යාලයේදී 2011.10.17 වන දින කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා ප්‍රදේශයේ මැති ඇමතිවරුන්ගේ සහභාගීත්වයෙන් විශ්ව ළමා දින සැමරුම් උත්සවයක් පවත්වන ලදී. අනුරාධපුර ස්වර්ණපාලී බාලිකා මහ විද්‍යාලයේ පාසල් සිසුන් 200 දෙනෙකු වෙනුවෙන් පාසැල් උපකරණ කට්ටල 200ක් ද පිරිනමන ලදී.

2011.10.18 වෙනි දින සිට 21 වෙනි දින දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ක් ආවරණය වන පරිදි පාසැල් සිසුන් සහ දෙමව්පියන් සඳහා අනර්ථකාරී ළමා ශ්‍රමය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 22ක් පවත්වන ලදී.ශ්‍රී ලංකා පොලීසියේ ළමා හා කාන්තා කාර්යාංශයේ නිලධාරීන්ගේ ද සහභාගීත්වය මේ සඳහා ලැබිණි.

**අනර්ථකාරී ළමා ශ්‍රමය වැළැක්වීමේ ව්‍යාපෘතිය**

මේ යටතේ සමාජ කොටස්කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 5ක් දිස්ත්‍රික් කම්කරු කාර්යාල 5ක් මුල් කොට ගෙන පැවැත්වීමට කටයුතු කරන ලදී. පරිවාස, කම්කරු හා පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ එක් දින වැඩසටහන් 03 ක් කොළඹ 07, ඔලිම්පික් නිවහනේ දී පවත්වන ලදී. අනර්ථකාරී ළමා ශ්‍රමය පිළිබඳව නව සංශෝධන පනතෙහි කරුණු ඇතුළත් පත්‍රිකා මුද්‍රණය කර, බෙදාහැරීමට කටයුතු කරන ලදී.

**වතු වැවිලි කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන**

මොණරාගල, හලාවත, හපුතලේ, මතුගම හා කළුතර ප්‍රදේශ වල වතු වැවිලි කාන්තාවන් වෙනුවෙන් කම්කරු නීති හා සමාජය දැනුවත්භාවය ලබා දීමේ අරමුණින්, වතු වැවිලි අංශයේ සේවයේ නියුතු කාන්තා සේවිකාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 15ක් පවත්වන ලදී.

**කර්මාන්තශාලා සේවිකාවන් දැනුවත් කිරීමේ (සේවාස්ථ) වැඩසටහන**

2011 වර්ෂය තුලදී කාන්තා හා ළමා කටයුතු අංශය විසින් සාප්පු කාර්යාල සහ කර්මාන්තශාලා වල සේවයේ නියතු සේවිකාවන්ගේ සුබ සාධනය, රැකියා සුරක්ෂිතභාවය හා සේවා කොන්දේසි කඩවීම යනාදී කරුණු පිළිබඳව දැනුවත් කිරිම උදෙසා සේවාස්ථ වැඩසටහන් 60ක් පවත්වා ඇත.

# 08 විශේෂ විමර්ශන අංශය

**කා**ර්මික සාමය බිඳ වැටෙන අවස්ථා වලදී මැදිහත් වීමෘ ජාතික වශයෙන් බලපාන ව්‍යාකූල ආරවුල් විසඳීම, ඒවායේ ව්‍යාප්තිය වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ ඒ පිළිබඳ විමසිලිමත් වීම මෙම අංශයේ වගකීම් අතර වේ.

අතිගරු ජනාධිපතිතුමා, ගරු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා, අමාත්‍යාංශයේ ලේකම් හා කම්කරු කොමසාරිස් ජනරාල් විසින් යොමු කරවනු ලබන විශේෂ මහජන පැමිණිලි පිළිබඳව පරීක්ෂා කර බලා වහාම පියවර ගැනීම මෙන්ම කම්කරු කොමසාරිස් ජනරාල්ගේ අනුමැතියට යටත්ව බහුවිධ පරීක්ෂණ පැවැත්වීම ද මෙම අංශයේ කාර්යභාරයට අයත් වේ.

2011 වර්ෂය තුළ විශේෂ විමර්ශන අංශය මගින් සිදු කරන ලද පරීක්ෂණ හා පැමිණිලි විභාග කිරීම් වලින් අත්කරගන්නා ලද ප්‍රතිඵල පහත දැක්වේ.

ගණනය කරන ලද හිඟ සේ.අ.අ. ප්‍රමාණය (රු.) 153,483,322.74
ගණනය කරන ලද හිඟ ව්‍යවස්ථාපිත මුදල් ප්‍රමාණය (රු.) 12,295,460.23

මෙම වර්ෂය තුළදී සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාත්මක වශයෙන් පහත දැක්වේ.

| | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව |
|---|---|---|---|---|
| හදිසි පරීක්ෂණ | 125 | 67 | 28 | 21 |
| ආංශික පරීක්ෂණ | 08 | 08 | 15 | 19 |
| සමූහ පරීක්ෂණ | 07 | 10 | 22 | 04 |
| මහා පරිමාණ පරීක්ෂණ | 17 | 22 | 16 | 20 |

**<u>තොරතුරු සැපයීමට අදාල කාර්යයන්</u>**

පහත දැක්වෙන ආයතන සඳහා තොරතුරු යොමු කිරීමේ කටයුතු සම්බන්ධීකරණය මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

I. පාර්ලිමේන්තු ප්‍රශ්න
II. පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව
III. පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව
IV. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්
V. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

මීට අමතරව කම්කරු දෙපාර්තමේන්තුව සම්බන්ධව මහජනතාවට අවශ්‍ය තොරතුරු හා සේවාවන් ලබාදීම පිණිස දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වා ගැනීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි. එමෙන්ම, රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයට හා එම වෙබ් අඩවියට අවශ්‍ය තොරතුරු ලබා දීමද සිදු කරනු ලබන්නේ මෙම අංශය මගිනි.

# 09 සේවක අර්ථසාධක අරමුදල් අංශය

1958 ජූනි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් අහිමි පෞද්ගලික හා සංස්ථා අංශයේ සේවකයින්ගේ විශ්‍රාම දිවිය සාර්ථක කර ගැනීමට මහඟු අත්වැලක් වීමේ අභිලාෂයෙන් වැදගත් සමාජ ආරක්ෂණ ක්‍රමයක් ලෙස 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කරන ලදී. මෙම අරමුදලේ පරිපාලනය කම්කරු කොමසාරිස් විසින් ද මූල්‍ය පාලනය ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ද සිදුකරනු ලබයි.

## 2011 වර්ෂය අවසාන වන විට සේවක අර්ථසාධක අරමුදල

| | අරමුදල ආරම්භක වර්ෂය අවසානයේදී (1959) | 2011 වර්ෂය අවසානයේදී |
|---|---|---|
| ■ සේ.අ.අ. දායකත්වය දක්වන සේවායෝජක සංඛ්‍යාව | 6,400 | 66,350 |
| ■ සේ.අ.අ. දායකත්වය දක්වන සේවක සංඛ්‍යාව (සක්‍රීය ගිණුම් සංඛ්‍යාව) | මිලියන 0.85 | මිලියන 2.3 |


මේ වන විට අරමුදලේ (ඇස්තමේන්තු ගත) සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 13.6 වන අතර අරමුදලේ ප්‍රමාණය රු.මි. 1,020,072 කි. අරමුදල ආරම්භක වර්ෂයේදී **(1959)** රැස් කල දායක මුදල රුපියල් මිලියන 12 වූ අතර, එය 2011 වර්ෂය අවසාන වන විට රුපියල් මිලියන 61,879 ක් දක්වා වර්ධනය වී ඇත.

2011 වර්ෂය තුලදී මෙම අරමුදල විසින් සිය සාමාජිකයන්ගේ ප්‍රතිලාභ අයදුම්පත් 120,301 වෙනුවෙන් රුපියල් මිලියන 47,311 ක් ප්‍රතිලාභ වශයෙන් අදාළ සාමාජිකයාට හෝ නීත්‍යානුකූල ප්‍රතිලාභියාට ගෙවන ලදී.

## දායක මුදල් රැස් කිරීම

පසුගිය දශකයක කාලය තුළ පනතේ සංශෝධනය හා පරිපාලන ප්‍රතිසංවිධාන ක්‍රියාවලිය හේතුකොට ගෙන වර්ෂයක් සඳහා දායක මුදල් වර්ධනය වූ ආකාරය පහත දක්වේ. (1999-2011)

| වර්ෂය | දායක මුදල (රු. මිලියන) |
|---|---|
| 2000 | 17,009 |
| 2001 | 17,934 |
| 2002 | 19,201 |
| 2003 | 20,348 |
| 2004 | 23,872 |
| 2005 | 24,324 |
| 2006 | 31,720 |
| 2007 | 40,574 |
| 2008 | 45,951 |
| 2009 | 48,712 |
| 2010 | 54,796 |
| 2011 | 61,879 |



**සේවක අර්ථසාධක අරමුදල් කටයුතු විමධ්‍යගත කිරීම**

සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ රැසක් ලබා දීම අරමුණු කර ගනිමින් සේවක අර්ථසාධක අරමුදල් පනතට නව සංශෝධන සිදු කිරීමට අවශ්‍ය මූලික කටයුතු නිමා කරන ලදී. එම සංශෝධන වල අරමුණ වන්නේ, නිවාස අවශ්‍යතාවයක් වෙනුවෙන් හෝ සෞඛ්‍ය ප්‍රතිකාර සඳහා සේවක ගිණුමේ ශේෂයෙන් 30% ක් ආපසු ගෙවීමයි.

සේවක අර්ථසාධක අරමුදල් අංශයේ 2011 ජනවාරි සිට 2011 දෙසැම්බර් දක්වා ප්‍රගතිය

| | |
|---|---|
| **ප්‍රතිලාභ ගෙවීම** | |
| • ප්‍රතිලාභීන් ගණන | 120,301 |
| • ගෙවූ ප්‍රතිලාභ මුදල | රු.මි. 47,311 |
| **සේ.අ.අ. දායක මුදල් හා අධිභාර මුදල් අයකර ගැනීම** | රු.මි. 61,992 |
| **සේ.අ.අ. නිවාස ණය ගෙවීම** | |
| • අනුමත කළ අයදුම්පත් සංඛ්‍යාව | 20,041 |
| • අනුමත කළ ණය මුදල | රු.මි. 6,355 |
| **නව සේවා යෝජකයන් ලියාපදිංචි කිරීම** | 8,131 |
| **සේ.අ.අ. සාමාජික වාර්තා පරිගණක ගත කිරීම** | |
| • දත්ත පරිගණක ගත කිරීම (ඒ සහ එච්) | 496,594 |
| • ස්කෑන් කිරීම (ඒ සහ එච්) | 309,725 |

**<u>මුදල් ආයෝජනය හා පොලී</u>**

2011 වර්ෂය තුල ආයෝජනය කර ඇති මුළු මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 987,966 කි . එය රජයේ සුරැකුම්පත්, භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ සමාගම් ණය පත්‍ර හා කොටස් වෙළඳපොල සඳහාද ආයෝජනය කර ඇත. 2011 වර්ෂය තුළ 11.50% පොලී අනුපාතයක් සමාජික ගිණුම් සඳහා ගෙවීමට කටයුතු කර ඇත.

**<u>සේ.අ.අ. සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය</u>**


සේ.අ.අ සාමාජිකයන්ට ඒකීය අංකන ක්‍රමයක් ලබාදීම සහ සේවකයන් කේන්ද්‍ර කර ගත් ක්‍රමයක් ගොඩනැගීම සඳහා වන සක්‍රීය සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ කටයුතු සමස්ත දිවයිනම ආවරණය වන පරිදි ඉටුකරන ලද අතර එහිදී සක්‍රීය සාමාජිකයන් ලක්ෂ 9.5 ගේ පමණ විද්‍යුත් මාධ්‍යයෙන් ඇඟිලි සලකුණු, ඡායාරූප සහ ජාතික හැඳුනුම්පත් අංක ලබා ගැනීම සිදු කරන ලදී.

මෙම වර්ෂය තුල ජංගම සේවා වැඩසටහන් 15, පුහුණු වැඩසටහන් හා පළාත් මට්ටමින් කම්කරු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

# 10 කර්මාන්තමය සුරක්ෂිතතා අංශය

**ක**ර්මාන්තශාලා වල සේවකයින්ගේ සුරක්ෂිතතාව, සෞඛ්‍ය, සුබ සාධනය තහවුරු කරනු වස් 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත ක්‍රියාවෙහි යෙදවීම මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ. කොළඹ, ගම්පහ, කුරුණෑගල, මහනුවර, ගාල්ල, යාපනය, අනුරාධපුර, රත්නපුර, බදුල්ල හා කළුතර යන නගර වල පිහිටි දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10 ක් මඟින් මුළු දිවයිනම ආවරණය වන පරිදි මෙම අංශය කටයුතු සිදු කරනු ලබයි.

කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම් සහ සිදු කරන ලද පරීක්ෂණ වල ප්‍රගතිය 2002 - 2011




| | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලියාපදිංචි කරන ලද කර්මාන්තශාලා ප්‍රමාණය | 11113 | 12324 | 13879 | 14384 | 15253 | 16057 | 17002 | 18247 | 20053 | 20971 |
| සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | 4420 | 4123 | 3670 | 4089 | 3916 | 3507 | 4344 | 4636 | 4482 | 4749 |

## ජාතික සුරක්ෂිතතා සම්මාන

මෙම සම්මාන ප්‍රදානය දෙවසරකට වරක් පවත්වනු ලබන අතර, කර්මාන්තමය සුරක්ෂිතතා අංශයේ ඉංජිනේරු මඩුල්ලක් විසින් සම්මානලාභීන් තෝරාගනු ලබයි. මෙය මහා පරිමාණ, මධ්‍ය පරිමාණ හා කුඩා පරිමාණ වශයෙන් අංශ 3 ක් යටතේ පවත්වනු ලබන අතර, ජාතික සුරක්ෂිතතා සම්මාන හා කර්මාන්තමය සුරක්ෂිතතා සම්මාන වශයෙන් දෙයාකාරයක සම්මාන ප්‍රදානය කරනු ලබයි.

## ලෝක සුරක්ෂිතතා දිනය ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය

සෑම වසරකම අප්‍රේල් මස 28 වන දින ලෝක සුරක්ෂිතතා දිනය සමරනු ලබන අතර මෙවර අධි අන්තරාදායී යන්ත්‍ර පිළිබඳව සම්මන්ත්‍රණයක් කොළඹ "සච්සිරිපාය" හිදී පැවැත්වීමට කටයුතු කරන ලදී. එමෙන්ම, සෑම වසරකම ඔක්තෝම්බර් මස දෙවන සතියේදී ජාතික වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍යය පිළිබඳ සතිය පවත්වනු ලබයි. 2011 වසරේ දී මෙම සතිය වෙනුවෙන් අංශයේ ඉංජිනේරුවරුන් විසින් ආයෝජන ප්‍රවර්ධන කලාපයන් හා රටපුරා විසිරී ඇති වෙනත් විධිමත් හා අවිධිමත් අංශයන් තුළ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. 2011 ඔක්තෝම්බර් මස 13 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී ජාතික මට්ටමේ සම්මන්ත්‍රණය පවත්වන ලදී.

**දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂණ ඉංජිනේරු කාර්යාලවල 2011 වසරේ කාර්යසාධනය**

| | අනුරාධපුර | ගම්පහ | කොළඹ | මහනුවර | ගාල්ල | රත්නපුර | යාපනය | කළුතර | කුරුණෑගල | බදුල්ල | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලියාපදිංචි කරන ලද මුළු කර්මාන්තශාලා | 1137 | 3205 | 3837 | 1968 | 3290 | 1332 | 2494 | 1256 | 1820 | 632 | 20971 |
| කර්මාන්තශාලා හා වෙනත් පරීක්ෂණ | 209 | 495 | 1592 | 395 | 181 | 459 | 321 | 372 | 471 | 254 | 4749 |
| මාරාන්තික අනතුරු | 04 | 14 | 12 | 04 | 04 | 05 | 03 | 05 | 02 | 07 | 60 |
| මාරාන්තික නොවන අනතුරු | 38 | 369 | 348 | 108 | 121 | 70 | - | 129 | 81 | 49 | 1313 |
| අන්තරාදායී සිදුවීම් | 01 | - | - | - | 02 | 01 | 02 | - | - | 01 | 07 |
| වාෂ්ප/හුමාල බොයිලේරු පරීක්ෂා | 97 | 207 | 260 | 81 | 28 | 80 | - | 250 | 244 | 69 | 1316 |
| වාෂ්ප/හුමාල ග්‍රාහක පරීක්ෂණ | 07 | 189 | 220 | 40 | 16 | 57 | - | 19 | 58 | 13 | 619 |
| වාත ග්‍රාහක පරීක්ෂණ | 47 | 462 | 366 | 273 | 104 | 300 | - | 76 | 296 | 53 | 1977 |
| වායු ග්‍රාහක පරීක්ෂණ | - | - | 71 | - | - | 04 | - | 47 | - | 18 | 140 |
| අනිකුත් අධිඅන්තරාදාය යන්ත්‍ර පරීක්ෂණ | 26 | 438 | 365 | 307 | 27 | 199 | - | 34 | 252 | 76 | 1724 |
| පිඹුරුපත් අනුමැතිය | 02 | 43 | 40 | - | 01 | 1 | 16 | 14 | 02 | 03 | 122 |
| දේශන සහ සම්මන්ත්‍රණ | 06 | 49 | 27 | 18 | 08 | 14 | 70 | 45 | 12 | 45 | 294 |
| උසාවිගත කරන ලද නඩු | - | 01 | 05 | 06 | - | - | - | - | 16 | - | 28 |

# 11 වෘත්තීය ස්වස්ථතා අංශය

වෘත්තීයමය ආපදා, වෘත්තීයමය රෝගාබාධ හා සේවා ස්ථානවල කටයුතු ආශ්‍රිතව ඇතිවන අයහපත් සෞඛ්‍ය තත්වයන් අවම කිරීම මෙම අංශයේ අරමුණ වේ.

අනතුරු හා උපද්‍රව වලින් තොර මෙන්ම වෘත්තීමය සෞඛ්‍ය මනාව සුරැකෙන සේවා පරිසරයක්, සේවකයන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ යාමට මෙන්ම, නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ වල ගුණාත්මකභාවය පවත්වා ගැනීමට හේතුවන බව නොරහසකි. කර්මාන්තශාලා ආඥා පනත අනුව සේවකයන්ගේ සෞඛ්‍ය හා සුරක්ෂිතභාවය නෛතික අවශ්‍යතාවයක් වේ. ඉහත පරමාර්ථයන් ඉටු කර ගැනීම සඳහා වෘත්තීය ස්වස්ථතා අංශය මගින් වැදගත් ක්‍රියාකාරකම් සමූහයක් සිදුකරනු ලබයි.

**පාරිසරික මිනුම්**

වර්ෂය තුල සිදු කරන ලද පාරිසරික මිනුම් සංඛ්‍යාව

| | |
|---|---|
| අදාළ ස්ථානයේදීම සිදු කල මිනුම් | 1070 |
| පරීක්ෂණාගාරය තුලදී සිදු කල මිනුම් | 220 |

**ජීව විද්‍යාත්මක පරීක්ෂණ**

වර්ෂය තුල සිදු කරන ලද ජීව විද්‍යාත්මක පරීක්ෂණ සංඛ්‍යාව 790කි.

**ශ්‍රවණ පරීක්ෂණ**

සිමෙන්ති, සෙරමික්, වීදුරු හා තාප ශක්ති භාවිතා කරන සේවා ස්ථානය තුළ දැඩි ඝෝෂාකාරී තත්වයන්ට නිතර මුහුණ දෙන සේවකයන් වෙනුවෙන් ශ්‍රවණ පරීක්ෂණ මෙම අංශය මගින් සිදුකරනු ලබයි.

**වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳව දැනුවත් කිරීම්**

අංශයේ නිලධාරීන් විසින් වර්ෂය තුලදී පහත සඳහන් පුද්ගල කණ්ඩායම් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

| | |
|---|---|
| - ආයතන කළමණාකරුවන් | 690 |
| - අධිකරණ මට්ටමේ නිලධාරීන් | 305 |
| - ආයෝජන ප්‍රවර්ධන කලාපීය සේවකයින් | 485 |
| - පුහුණුවන මහජන සෞඛ්‍ය නිලධාරීන් | 35 |
| - පශ්චාත් උපාධිධාරීන්/හදාරන්නන් | 62 |

**සේ.අ.අ. වෛද්‍ය මණ්ඩලය**

සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුවේ වෛද්‍ය මණ්ඩලයේ සභාපතිධූරය වෘත්තීය ස්වස්ථතා අංශයේ නියෝජ්‍ය කම්කරු කොමසාරිස් විසින් දරනු ලබයි.

සේවය කිරීමට නොහැකි පරිදි රෝගාබාධ හෝ අනතුරු ඇතිවීම හේතුවෙන් විශ්‍රාම වයස සම්පූර්ණ වීමට පෙර, සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම සඳහා අනුමැතිය ලබා දෙනු ලබන්නේ මෙම මණ්ඩලය මගිනි. 2011 වසර තුළ වෛද්‍ය මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වන ලද අතර 600 කට අධික සේවක සංඛ්‍යාවක් පරීක්ෂාවට ලක් කරන ලදී.

**සේවක වන්දි තක්සේරුකරණය**

මෙම අංශය මගින් සිදු කරනු ලබන වැදගත් කාර්යයක් වනුයේ වෘත්තීයමය රෝගාබාධ හා අනතුරු සම්බන්ධයෙන් සේවකයන්ට ගෙවිය යුතුවන සේවක වන්දි ප්‍රමාණය තක්සේරු කිරීමයි. 2011 වසර තුළ සේවකයන් 48 දෙනෙකු පරීක්ෂාවට ලක් කරන ලදී.

# 12 සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය

**දෙ**පාර්තමේන්තුවේ ඵලදායීතාවය ඉහල නැංවීම පිණිස කුසලතා පිරිපුන් නිලධාරීන් පිරිසක් බිහිකිරීම, කාර්මික සාමය ස්ථාපිත කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ සැලසුම් සකස් කිරීම හා ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, දත්ත රැස්කිරීම හා පර්යේෂණ පැවැත්වීම සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශයේ මෙහෙවර වේ. මෙහිදී, ප්‍රධාන ක්ෂේත්‍රයන් 04 ක් යටතේ අංශය විසින් සිය කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි.

01. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පුහුණු කටයුතු
02. සැලසුම් හා පර්යේෂණ
03. ප්‍රගති සමාලෝචන
04. ප්‍රකාශන කටයුතු

**සැලසුම් හා පර්යේෂණ**

දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර සඵලදායී ලෙස ළඟාකර ගැනීම සඳහා සිදු කරනු ලබන කටයුතු වලට විධිමත් මඟ පෙන්වීමක් ලබාදෙන පරිදි මනා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමත්, එම ක්‍රියාකාරකම්වල කාර්තුමය ප්‍රගතිය පිළිබඳව සොයා බැලීමත් මෙම අංශය මගින් සිදු කරනු ලබන අතර, එමගින් දෙපාර්තමේන්තුවේ විවිධ අංශවලට තම කාර්යභාරය පිළිබඳ නිසි අවබෝධයක් ලබා ගත හැකි වේ. එමෙන්ම සැලසුම් කළ තත්ත්වයෙන් විචලනයක් සිදු වන විට නැවතත් ඉලක්කගත කාර්යසාධනය වෙත ළඟාවීමට මඟපෙන්වීමද මේ මගින් සිදු වේ. විශේෂයෙන් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිත ආයතනයේද සහයෝගය ඇතිව සකස් කරන ලද සුනිසි මෙහෙවර මාර්ගෝපදේශයෙහි සඳහන් ඉලක්කයන් ළඟා කර ගැනීම උදෙසා කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය විසින් දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ලබන මූල්‍ය ප්‍රතිපාදන මගින් සිදු කරන වැඩසටහන්හි ප්‍රගතිය අධීක්ෂණය කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි. 2011 වර්ෂයේ දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් ප්‍රතිපාදන වලින් 100% ක ප්‍රගතියක් ලබාගැනීමට කටයුතු කර ඇත.

**ප්‍රගති සමාලෝචන**

කම්කරු දෙපාර්තමේන්තුවේ සියළුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල වල කම්කරු පරීක්ෂණ, කම්කරු දෙපාර්තමේන්තුවට යොමු වන පැමිණිලි, දෙපාර්තමේන්තුවේ නඩු කටයුතු, සේවා තත්වයන් හා කොන්දේසි පවත්වා ගෙන යාමට අදාළ, අනෙකුත් කාර්යයන් හා සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් ත්‍රෛමාසිකව කලාපීය මට්ටමින් කම්කරු කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් හා අනෙකුත් අංශ වල කොමසාරිස්වරුන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වේ. මෙමගින් දෙපාර්තමේන්තුවේ කටයුතු වල කාර්යක්ෂමතාවය හා කඩිනම්භාවය ඉහළ නැංවීම අපේක්ෂා කරයි. 2011 වර්ෂය තුළ මෙබඳු ප්‍රගති සමාලෝචන රැස්වීම් 07 ක් පැවැත්වීමට කටයුතු කර ඇත.

**කම්කරු විගණන කටයුතු**

ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී හා ඊට සමගාමීව මෙම අංශයේ නිලධාරීන් විසින් සිදු කරනු ලබන පරීක්ෂා කිරීම් වලදී, දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන්හි නිරීක්ෂණයට භාජනය වන යම් යම් ගැටළුකාරී තත්වයන් පිළිබඳව වඩාත් ගැඹුරින් අධ්‍යයනය කිරීම කම්කරු විගණන ඒකකය මගින් සිදු කරනු ලබයි. හඳුනා ගනු ලබන ගැටළුකාරී තත්වයන් නිවැරදි කර ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම තුළින් අනාගතයේදී එවැනි අකාර්යක්ෂමතා හා වැරදි සිදු නොවීමට කටයුතු කල හැක.

**ප්‍රකාශන**

දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් වෙනුවෙන් කම්කරු අණ පනත් මුද්‍රණය කිරීම මෙම අංශය විසින් සිදුකරනු ලබන අතර මෙම වර්ෂය තුළදී පහත සඳහන් අණ පනත් මුද්‍රණය කරන ලදී.

01. 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත

02. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත

06. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත

මීට අමතරව චක්‍රලේඛ, කම්කරු නඩු තීන්දු, කම්කරු පරීක්ෂණ අත්පොත් හා වෙනත් විවිධ ලේඛන මුද්‍රණය කරන ලදී.

**දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පුහුණු කටයුතු**

2011 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ විවිධ මට්ටම් වල නිලධාරීන් වෙනුවෙන් පැවැත්වූ පුහුණු කටයුතු පහත පරිදි වේ.

| වැඩසටහන / විෂයය | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| කම්කරු නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් | 16 |
| කළමණාකරන සහකාර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් | 14 |
| පරිගණක පුහුණු වැඩසටහන් | 16 |
| දෙපාර්තමේන්තුමය සහකාර කම්කරු කොමසාරිස්වරුන් සඳහා හැකියා වර්ධන පුහුණු වැඩමුළු | 01 |
| කම්කරු නිලධාරීන් සඳහා වන හැකියා වර්ධන පුහුණු වැඩමුළු | 04 |
| මානව සම්පත් සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු | 01 |
| වෙනත් පුහුණු වැඩසටහන් | 02 |

මීට අමතරව 2011 වසර තුල නිලධාරීන් 26 ක් වෙනුවෙන් පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා සඳහාද, නිලධාරීන් 44 දෙනෙක් වෙනුවෙන් බාහිර ආයතන මගින් පවත්වන පුහුණු වැඩසටහන් 37 ක් සඳහා ද මූල්‍යමය ප්‍රතිපාදන සලසන ලදී.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිතායතනය සමග සම්බන්ධව කම්කරු ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා විශාල වැඩ කොටසක් 2011 වර්ෂය තුල සිදුකරන ලදී. ඒවා නම්,

- කම්කරු පරීක්ෂණ මාර්ගෝපදේශ අත්පොත සකස් කිරීම.
- දෙපාර්තමේන්තුවේ ද්විතීක හා ජ්‍යෙෂ්ඨ ශ්‍රේණි වල නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තීන් හා කම්කරු නීති යලි සකස් කිරීම පිළිබඳ වැඩමුළු පැවැත්වීම.
- දෙපාර්තමේන්තුව සඳහා ඒකාබද්ධ සැලැස්මක් පිළියෙල කිරීම වෙනුවෙන් කටයුතු ආරම්භ කිරීම.
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ කම්කරු පරීක්ෂණ පිළිබඳ පුහුණු අත්පොත මෙරටට ගැලපෙන පරිදි යලි සකස් කිරීම.

# 13 සංඛ්‍යාලේඛන අංශය

ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයේ සංවිධානය වූ අංශයට අදල දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ ප්‍රකාශයට පත්කිරීම සංඛ්‍යාලේඛන අංශයේ ප්‍රධාන කාර්යය වේ. මේ සඳහා වාර්ෂිකව තැපැල් මාර්ගිකව පවත්වනු ලබන ප්‍රධාන සමීක්ෂණ දෙකකින් පැය ගණන පිළිබඳව දත්ත එක්රැස් කරනු ලැබේ. ඒ සමග විවිධ පරිපාලන දත්ත වක්‍ර ගත කිරීම, අවම වැටුප් දර්ශකාංකය සකස් කිරීම මෙම අංශයෙන් ඉටු කරන අනෙකුත් කාර්යයන් වේ.

**වාර්ෂික රැකියා සමීක්ෂණය**

දිවයිනේ පරිපාලන සහ ක්‍රම සම්පාදන අවශ්‍යතා සඳහා ඉවහල් වන සංඛ්‍යාන දත්ත එක් රැස් කිරීමේ අරමුණින් සෑම වසරකම ජූනි මාසයට අදාළව සේවකයින් 5 දෙනෙකු හෝ ඊට වඩා වැඩි සේවා නියුක්තියක් ඇති පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තියට අදාළ තොරතුරු රැස් කරනු ලැබේ. මේ වන විට 2010 වර්ෂයේ රැකී රක්ෂා සමීක්ෂණ වාර්තාව සකස් කර අවසන් වී ඇති අතර මුද්‍රණ කටයුතු සඳහා සූදානම් කෙරෙමින් පවතී.

ගෝලීය ආර්ථික අර්බුදය හමුවේ ශ්‍රී ලංකාවේ ඇතැම් කර්මාන්තශාලා වැසී යාම නිසා 2009 වර්ෂයේදී පෞද්ගලික අංශයේ රැකියා නියුක්ත සේවක සංඛ්‍යාව 59.3% වූ අතර 2010 වසරේදී 61.5% දක්වා සුළු ප්‍රමාණයකින් ඉහළ ගොස් තිබේ. මේ සමගම 2009 වසරේදී 40.7% ක් වූ අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 2010 වසර වන විට 38.5% ක් දක්වා පහළ බැස ඇත.

**කම්කරු සංඛ්‍යාති - 2011 ප්‍රකාශනය මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීම**

කම්කරු ක්ෂේත්‍රයට අදාල කාලීන හා විශ්වසනීය තොරතුරු ඇතුළත් කම්කරු සංඛ්‍යාති - 2011 වාර්ෂික ප්‍රකාශනය අදාල කාලය තුළ මුද්‍රණය කර ප්‍රකාශයට පත් කරන ලදී.

**සාමාන්‍ය ඉපැයීම් හා වැඩකල පැය ගණන පිළිබඳ සමීක්ෂණය**

අර්ධ වාර්ෂිකව පවත්වනු ලබන මෙම සමීක්ෂණයේ ප්‍රධාන අරමුණු වනුයේ, පඩි පාලක සභා මගින් අවම වැටුප් නියම කර ඇති කර්මාන්ත ආයතන වල වැඩ කරන සේවකයින්ගේ මාසික සාමාන්‍ය ඉපැයීම් සහ වැඩ කරන පැය ගණන් පිළිබඳ තොරතුරු රැස්කිරීමයි.

නියැදි පදනමක් මත තෝරාගත් ආයතන වලට තැපැල් මාර්ගිකව යවනු ලබන ප්‍රශ්නාවලියක් මගින් සෑම වසරකම මාර්තු සහ සැප්තැම්බර් මාස වල දී මෙම සමීක්ෂණය පවත්වනු ලැබේ. මෙම සමීක්ෂණය මඟින් ලබා ගන්නා තොරතුරු ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ජිනීවා හි ජාත්‍යන්තර කම්කරු කාර්යාලය වැනි ජාතික හා අන්තර් ජාතික ආයතනවලට ද යවනු ලැබේ. අදාල කාලය තුලදී 2011 මාර්තු හා සැප්තැම්බර් මාස වල පවත්වන ලද සමීක්ෂණ දෙකෙහි සම්පින්ඩන වාර්තාව සකස් කර අවසන් කරන ලදී.

ඒ අනුව, 2000 සිට 2010 දක්වා කාල පරිච්ඡේදය තුලදී නිෂ්පාදන අංශයේ දෛනික ඉපැයීම රු.221.11 සිට රු.488.68 දක්වා 121% කින් වර්ධනය වී තිබේ. ඉදිකිරීම් අංශය සහ කෘෂිකාර්මික අංශයට අදාල වැවිලි ක්ෂේත්‍රයේ වර්ධනය පිළිවෙලින් 116% ක් සහ 245% කි.

**අංශය අනුව සාමාන්‍ය දෛනික ඉපැයීම 2001 - 2010 (රු.)**

| අංශය / වර්ෂය | කෘෂිකර්මාන්තය (වැවිලි අංශය) (රු.) | නිෂ්පාදන අංශය (රු.) | ඉදිකිරීම් අංශය (රු.) |
|---|---|---|---|
| 2000 | 104.12 | 221.11 | 285.99 |
| 2001 | 112.11 | 230.66 | 263.12 |
| 2002 | 128.72 | 273.10 | 259.63 |
| 2003 | 138.43 | 306.28 | 276.42 |
| 2004 | 152.94 | 310.84 | 335.70 |
| 2005 | 178.47 | 336.49 | 416.75 |
| 2006 | 206.33 | 356.11 | 424.55 |
| 2007 | 198.01 | 411.60 | 408.37 |
| 2008 | 298.85 | 469.47 | 443.91 |
| 2009 | 323.20 | 492.93 | 472.58 |
| 2010 | 359.45 | 488.68 | 616.61 |

**අවම වැටුප් දර්ශකාංකය 2000 - 2011 (පදනම 1978 = 100)**

පඩිපාලක සභා යටතේ කම්කරු කොමසාරිස් ජනරාල් විසින් නියම කරනු ලබන අවම වේතන හා ඒවායේ කාලීන සංශෝධන පදනම් කරගෙන මාසිකව හා වාර්ෂිකව මෙම දර්ශකාංකය ගණනය කරනු ලැබේ.

| වර්ෂය | කෘෂිකර්මය (වැවිලි අංශය) | වාණිජ සහ කර්මාන්ත අංශය | සේවා අංශය | සියළු අංශ සඳහා |
|---|---|---|---|---|
| 2000 | 1,142.7 | 857.1 | 559.7 | 1,000.4 |
| 2001 | 1,176.4 | 919.7 | 657.6 | 1,049.2 |
| 2002 | 1,269.6 | 986.5 | 678.0 | 1,126.5 |
| 2003 | 1,382.3 | 1,009.4 | 678.0 | 1,205.3 |
| 2004 | 1,397.7 | 1,044.1 | 751.0 | 1,233.1 |
| 2005 | 1,527.4 | 1,078.4 | 779.7 | 1,329.7 |
| 2006 | 1,567.1 | 1,090.6 | 779.7 | 1,358.2 |
| 2007 | 1,821.4 | 1,522.4 | 157.0 | 1,648.7 |
| 2008 | 2,286.6 | 1,877.5 | 1,370.8 | 2,070.4 |
| 2009 | 2,349.4 | 2,053.9 | 1,545.8 | 2,171.4 |
| 2010 | 3,328.0 | 2,199.0 | 1,673.3 | 2,865.3 |
| 2011 | 3427.22 | 2402.08 | 1851.80 | 2996.09 |

# 14 මුදල් අංශය

**දෙ**පාර්තමේන්තුවේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා මුදල් රෙගුලාසි වලට අනුකූල වෙමින්, මනා මූල්‍ය පරිපාලනයක් ඇති කිරීම තම අරමුණ කරගත් මෙම අංශය වාර්ෂික ඇස්තමේන්තු වලින් වෙන් කරනු ලබන මුදල් විධිමත්ව හා කාර්යක්ෂමව වැය කිරීමත්, ඒ ඒ කාර්යාල හා අංශ වල අවශ්‍යතාවයන් පරිදි එක් එක් ව්‍යාපෘති වලට අවශ්‍ය මුදල් වෙන් කරමින් කාලානුරූපීව අදාල වියදම් දරමින් දෙපාර්තමේන්තුවේ ඉලක්ක සපුරා ගැනීමත් සිදු කරනු ලබයි.

**අභ්‍යන්තර විගණන අංශය**

අභ්‍යන්තර පාලන පද්ධතීන් සැලසුම් කරන ලද ආකාරයට ස්වාධීන තහවුරුවක් ලැබෙන පරිදි ද රාජ්‍ය ගිණුම්කටයුතුභාවය සුරැකෙන පරිදි ද දෙපාර්තමේන්තුවේ කටයුතු සිදුවන බවට කළමනාකරණ විගණනයක් තුළින් තහවුරු කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

2011 වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රු.982,340,000/- ක මුදලක් වෙන්වූ අතර එයින් රු. 969,988,671.85 ක් වැය කරන ලදී. එමෙන්ම, ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වෙන්වූ රු.371,936,197/- ක මුදලින් රු. 333,261,334/- ක මුදලක් වැය කරන ලදී. මේ අනුව ප්‍රාග්ධන වියදම් සම්බන්ධව 89.60% ක හා පුනරාවර්තන වියදම් සම්බන්ධව 98.74% ක ප්‍රගතියක් ලඟා කර ගන්නා ලදී.

| විස්තරය | | 01 මෙහෙයුම් වැඩසටහන | 02 සංවර්ධන වැඩසටහන | | |
|---|---|---|---|---|---|
| | | 1-1 | 2-2 | 2-3 | 2-4 |
| පුනරාවර්තන | ප්‍රතිපාදන | 593,210,000.00 | 59,355,000.00 | 47,595,000.00 | 282,180,000.00 |
| | වියදම | 592,329,924.18 | 55,336,910.66 | 46,083,438.88 | 276,238,398.13 |
| ප්‍රාග්ධන | ප්‍රතිපාදන | 78,000,000.00 | 4,333,197.00 | 3,400,000.00 | 286,203,000.00 |
| | වියදම | 41,503,983.00 | 3,255,804.00 | 3,127,123.00 | 285,374,424.00 |

# අභ්‍යන්තර විගණන අංශය

2011 වර්ෂයේ යෝජිත ක්‍රියාකාරී වැඩ සැලැස්ම අනුව ප්‍රගති සමාලෝචන කටයුතු පිළිබඳ පරීක්ෂණ ඇතුළු දෙපාර්තමේන්තුවට අයත් විවිධ අංශයන් 52 ක් පරීක්ෂා කිරීමට නියමිත විය. ඉන් කාර්යාල 27 ක් පරීක්ෂා කර ඒ ඒ අංශයන් වල සිදු වී ඇති දුර්වලතා හඳුනා ගෙන නිවැරදි කර ගැනීම සඳහා වන යෝජනාවන්ද ඇතුලත් වන අභ්‍යන්තර විගණන වාර්තා පිළියෙල කර ඉදිරිපත් කර ඇත. කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා යෝජිත කර්යාල පනස් දෙකෙන් පරීක්ෂා කිරීමට හැකි වූයේ 27 ක් පමණි.

# 15 පාලන අංශය

කම්කරු දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යභාරය සකස් කිරීම හා වර්ධනය කිරීම සහ භෞතික සම්පත් සහ මානව සම්පත් වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම මෙම අංශයෙහි වගකීමයි.

මෙම අංශය යටතේ අනු අංශ 04 ක් ක්‍රියාත්මක වේ.

- පාලන ශාඛාව
- ආයතන ශාඛාව
- ගොඩනැගිලි නඩත්තු ඒකකය
- පුස්තකාලය හා තොරතුරු සේවය

පාලන අංශයේ වගකීම ඵලදායී අන්දමින් ඉටුකරමින් 2011 වසරේදී කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල වැඩි දියුණු කිරීම සඳහා පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී.

| කාර්යාලය | වැය කල මුදල |
|---|---|
| හපුතලේ කාර්යාලයේ පඩිපෙල ආවරණය සඳහා අත්වැට සකස් කිරීම | 26,178.46 |
| මහනුවර කලාප කම්කරු කාර්යාලයට බෙදුම් ඇඳි සවිකිරීම | 712,288.79 |
| අම්පාර කම්කරු කාර්යාලය ඉදිකිරීම II අදියර | 2,282,935.48 |
| මහනුවර කම්කරු ලේකම් කාර්යාලයේ විදුලි පරිපථය සවිකිරීම හා අලුත්වැඩියා කිරීම | 68,562.50 |
| කළුතර කම්කරු කාර්යාලය ඉදිකිරීම III අදියර | 1,517,996.48 |
| මඩකලපුව කම්කරු කාර්යාලය ඉදිකිරීම I අදියර | 3,806,994.71 |
| මඩකලපුව කම්කරු කාර්යාලය ඉදිකිරීම II අදියර | 2,090,111.22 |
| යාපනය පළාත් කම්කරු කාර්යාලය ඉදිකිරීම | 11,313,885.08 |
| අනුරාධපුර ස.කම්.කො. කාර්යාලය අලුත්වැඩියා කිරීම | 66,738.00 |
| අනුරාධපුර කලාප කම්කරු කාර්යාලයේ ඉදිකිරීම II අදියර | 1,397,503.70 |
| අනුරාධපුර කලාප කම්කරු කාර්යාලයේ ඉදිකිරීම III අදියර | 1,004,661.74 |
| කුලියාපිටිය දිස්ත්‍රික් කම්කරු කාර්යාලය ඉදිකිරීම | 1,991,794.75 |
| කටුනායක නේවාසිකාගාරයේ තාප්පය ඉදිකිරීම | 318,173.30 |
| කළුතර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තාප්පය ඉදිකිරීම | 2,210,465.85 |
| උතුරු මැද කම්කරු කාර්යාලය ඉදිකිරීම | 467,308.80 |
| මොණරාගල ගබඩා සංකීර්ණය හා ලේඛනාගාරය ඉදිකිරීම III අදියර | 850,009.66 |
| කළුතර කම්කරු කාර්යාලයේ බෙඳුම් ඇඳි සවිකිරීම | 547,212.31 |
| මුරකුටියක් ඉදිකිරීම හා කාර්යාලය ප්‍රධාන දොරටුව අසල කවුළුව ආවරණය - කළුතර | 129,000.00 |

2011 වර්ෂය තුලදී අනුරාධපුර කලාප කම්කරු කාර්යාලය ඉදිකිරීමේ II වන අදියර, අම්පාර, කුලියාපිටිය, කළුතර, හපුතලේ, මොණරාගල දිස්ත්‍රික් කම්කරු කාර්යාල වල හා කන්තලේ උප කම්කරු කාර්යාලය ඉදිකිරීම් කටයුතු අපේක්ෂිත පරිදි අවසන් කර ගැනීමට නොහැකි විය. එයට හේතු වූයේ කොන්ත්‍රාත්කරුවන් වැඩ පැහැර හැරීම, නැගෙනහිර පළාතේ පැවති නිරන්තර වර්ෂාව ජල ගැලීම්, අමුද්‍රව්‍ය නිසි කලට සපයා ගැනීමට ඇති වූ අපහසුතා හා අමතර විදුලි සැපයුමක් ලබා ගැනීමට නොහැකි වීම වැනි අනපේක්ෂිත ගැටලුවේ.

**දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල විස්තර**

| | |
|---|---|
| වර්ෂය ආරම්භයේ සිටි මුළු සේවක සංඛ්‍යාව | 2214 |
| නව බඳවා ගැනීම | 159 |
| ස්ථාන මාරුවී දෙපාර්තමේන්තුව වෙත පැමිණීම් | 25 |
| විශ්‍රාම ගැනීම | (67) |
| දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවී ගිය සංඛ්‍යාව | (14) |
| වෙනත් ආකාරයකට දෙපාර්තමේන්තුව හැරයාම් | (20) |
| වර්ෂය අවසානයේ සේවක සංඛ්‍යාව | 2299 |

**වර්ෂය තුළ නව බඳවා ගැනීම් හා වර්ෂය තුළ විශ්‍රාම යාම්**

| | නව බඳවා ගැනීම් | විශ්‍රාම යාම් |
|---|---|---|
| සහකාර කම්කරු කොමසාරිස් | 04 | 07 |
| කම්කරු නිලධාරී | - | 13 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 140 | 37 |
| කාර්යාල සේවක සේවය | - | 09 |
| කාර්යාල කම්කරු | 12 | - |
| රියදුරු | 02 | - |
| මුරකරු | 01 | - |
| කොම්ටෝ මීටර් ක්‍රියාකරු | - | 01 |

**ශිෂ්‍යත්ව, සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා විදේශ ගතවීම්**

| | නම | තනතුර | රට - පාඨමාලාව/සම්මන්ත්‍රණය/වැඩමුළුව | කාලසීමාව |
|---|---|---|---|---|
| 01 | ආර්.එන්.ඒ.පී. සුජීවා මෙය | කම්කරු නිලධාරී | ඉන්දියාව -Training Programme on Gender Issues in Labour | 2011.03.01 - 2011.03.18 |
| 02 | කේ.එල්.කේ. පෙරේරා මයා | ස.කම්.කො. | තායිලන්තය - Asia pacific Knowledge Sharing Network on Industrial Relation (AP - IR Net) Vision Event | 2011.04.26 - 2011.04.28 |
| 03 | ආර්.එල්.ඒ. සරත් කුමාර මයා | කම්කරු නිලධාරී | තායිලන්තය - Master of Arts in Diplomacy and International Studies | 2011.09 - 2013.08 |
| 04 | ප්‍රියන්ත විදානපතිරණ මයා | නීති නිලධාරී (වැ.බ.) | ඉන්දියාව - Training Programme on Advanced Programme for IT in Low Enforcement | 2011.10.03 - 2011.11.11 |
| 05 | පී.බී.සී. ප්‍රේමබන්දු මෙය | කම්කරු නිලධාරී | ඉන්දියාව - International Training Programme on Labour and Employment Relations in a Global Economy | 2011.11.07 - 2011.11.25 |
| 06 | ඩී.පී.කේ.ආර්. වීරකෝන් මයා | කම්·කො· | චීනය- Asian High Level Seminar on Social Security Extention | 2011.09.14 - 2011.09.16 |
| 07 | ඩී.ආර්. පෙරේරා මිය | ස·කම්·කො· | නේපාලය - Technical Seminar on "Adequancy and quality of social security benefits and service" | 2011.12.19 - 2011.12.20 |
| 08 | කේ.එච්.ඩබ්. කරුණාරත්න මිය | ස·කම්·කො· | නේපාලය - Technical Seminar on "Adequancy and quality of social security benefits and service" | 2011.12.19 - 2011.12.20 |
| 09 | හේරත් යාපා මයා | අති.කම්·කො.-ජ. | ඉන්දුනීසියාව - ADB workshop on social Inclusiveness in Asia's Middle Income Countries | 2011.09.13 |
| 10 | ඩබ්.එල්.එස්. විජේසුන්දර මිය | කම්.කො. | කොරියාව - Fellowship Training on Employment Injury Insurance (E11) | 2010.11.22 - 2010.11.27 |
| 11 | ඩබ්.එම්. පලිපාන මයා | නි·කම්·කො· | කොරියාව - Fellowship Training on Employment Injury Insurance (E11) | 2010.11.22 - 2010.11.27 |
| 12 | එස්.පී. සූරියආරච්චි මයා | ස·කම්·කො· | බංගලාදේශය - South Asia Regional Seminar on Social Security coverage to informal Sector workers | 2010.10.18 - 2010.10.21 |
| 13 | වී.බී.පී.කේ. වීරසිංහ මිය | කම්·කො.ජ. | ජිනීවා - 100th Session of the ILO International Labour Conference | 2011.05.30 - 2011.06.13 |
| 14 | කේ.ඩී. මනෝජ් ප්‍රියන්ත මයා | කම්·කො· | ජිනීවා - 100th Session of the ILO International Labour Conference | 2011.05.30 - 2011.06.13 |
| 15 | එම්.අයි.ආර්.ඒ. ජයතිලක මයා | ස.කම්·කො· | ජිනීවා - 100th Session of the ILO International Labour Conference | 2011.05.30 - 2011.06.13 |
| 16 | පී.එස්. පතිරත්න මයා | ජ්‍යෙෂ්ඨ නීති උපදේශක | ජිනීවා - 100th Session of the ILO International Labour Conference | 2011.05.30 - 2011.06.13 |
| 17 | වී.බී.පී.කේ. වීරසිංහ මිය | කම්·කො.ජ. | ඉතාලිය - Academy on Labour Administration & Labour Inspection (ITC) | 2011.10.24 - 2011.11.04 |